# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2109/11 – 2019 පෙබරවාරි 05 වැනි අඟහරුවාදා – 2019.02.05**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දඹදෙනිහත්පත්තුව සුළු කොට්ඨාසයේ, අංක 993, සෙරපිස්වත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, සෙරපිස්වත්ත ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක කේයු/පීඑල්ජී/ 2018/01 සහ 2018.01.29 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් සහ ප්‍රමාණවලින් යුත් ඉඩම් කොටස්වලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – සෙරපිස්වත්ත – ප්‍රමාණය: හෙක්. 2.5721 ක් පමණ**

උතුරට: දුම්රිය මාර්ග රක්ෂිතය; නැගෙනහිරට: දුම්රිය මාර්ග රක්ෂිතය සහ ඊදැල්ල ජනපදය වරි. අංක 132 දරන ඉඩම; දකුණට: කැබලි අක්ෂර බී, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය හිමිකම් කියන සෙරපිස්වත්ත සහ ආයෝජන මණ්ඩලය හිමිකම් කියන ඉඩම; බටහිරට: ආයෝජන මණ්ඩලය හිමිකම් කියන ඉඩම.

02. **කැබලි අක්ෂර 'බී' – සෙරපිස්වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0448 ක් පමණ**

උතුරට: කැබලි අක්ෂර ඒ සහ ඊදැල්ල ජනපදය වරි. අංක 132 දරන ඉඩම; නැගෙනහිරට: ඊදැල්ල ජනපදය වරි. අංක 132 දරන ඉඩම; දකුණට: මාර්ගය සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය හිමිකම් කියන සෙරපිස්වත්ත; බටහිරට: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය හිමිකම් කියන සෙරපිස්වත්ත.

ගයන්ත කරුණාතිලක,<br>
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/9/2017/ඩබ්ලිව්එස්/504.<br>
2018 ඔක්තෝබර් මස 25 වැනි දින.<br>
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,<br>
"මිහිකත මැඳුර",<br>
රජමල්වත්ත පාර,<br>
බත්තරමුල්ල.

02 – 660


1A – G 29409 – 21 (2019/02)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 11/3/3/1/9ඒ/44.
ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ
යොමු අංකය: එල්ඩී/05/2007/එම්වී/305ඒ.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ, 5 වන වගන්තිය යටතේ අංක 1736/22 සහ 2011.12.13 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ*, දමිළ පිටපතේ අංක 4ඒ දරන පිටුවේ කැබලි අක්ෂර 'සී' දරන කැබැල්ලේ ඇතුළත් භූමි ප්‍රමාණය හෙක්. 0.4725 ක් ලෙස ඇතුළත් වුව ද, එය හෙක්. 2.4725 ලෙස සංශෝධනය විය යුතු බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. ඩී. පී. ජයසූරිය,
ප්‍රාදේශීය ලේකම්,
ලග්ගල - පල්ලේගම.

2019 ජනවාරි මස 31 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
ලග්ගල - පල්ලේගම.

02 – 662